# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2010/33 - 2017 මාර්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2017.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදනයයි

එල්. ඩී. බී. 2/ 1999

**1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය පනත.**

1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද අමරවීර (පා. ම.)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය,

කොළඹ දී ය.

### නියෝග

2011 දෙසැම්බර් මස 13 වැනි දින අංක 1736/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) I වන උපලේඛනයේ "අ" ගණයේ (i), (ii) සහ (iii) වන අයිතම වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් :-

| | | |
|---|---|---|
| "(i) | වාරකාල ජලාශවල සහ වතු ජලාශවල වරල් මසුන් වගාව | |
| | හෙක්ටයාර් 05 දක්වා | 500.00 |
| | හෙක්ටයාර් 05 ට වැඩි | 1,000.00 |
| (ii) | හෙක්ටයාර් 1 දක්වා වූ ඉඩම් ප්‍රමාණයක මිරිදිය පොකුණුවල වරල් මසුන් හා මිරිදිය ඉස්සන් වගාව | 200.00 |
| (iii) | කුඩා පරිමාණයේ සුරතල් මසුන් නිෂ්පාදනය (වසරකට මසුන් 10,000 දක්වා) | 00.00", |

1A- PG 003452 - 2,507 (2017/03)

මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(2) I වන උපලේඛනයේ "ඈ" ගණයේ (i) වන (ii) වන, සහ (ix) වන අයිතම වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් :-

| | | |
|---|---|---|
| "(i) | හෙක්ටයාර් 1 සිට 4 දක්වා ඉඩම් ප්‍රමාණයක මිරිදිය පොකුණුවල මසුන් හා මිරිදිය ඉස්සන් වගාව | 500.00 |
| (ii) | හෙක්ටයාර් 1 දක්වා වූ ඉඩම් ප්‍රමාණයක කිවුල්දිය පොකුණුවල වරල් මසුන්, කකුළුවන් සහ අනෙකුත් අපෘෂ්ඨවංශීන් වගාව | 750.00 |
| (අ) | හෙක්ටයාර් 1 දක්වා වූ ඉඩම් ප්‍රමාණයක කිවුල් දිය පොකුණුවල ඉස්සන් වගාව | 1,000.00 |
| (ix) | ලක්ෂ 1 සිට මිලියන 1 දක්වා වූ සුරතල් මසුන් වගාව | 1,500.00" |

(3) I වන උපලේඛනයේ "ඈ" ගණයේ:-

(i) (i) වන සහ (ii) වන අයිතම වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන්:-

| | | |
|---|---|---|
| "(i) | හෙක්ටයාර් 1 ක් හෝ ඊට වැඩි වන සෑම ඉඩම් ප්‍රමාණයක කිවුල් දිය පොකුණුවල වරල් මසුන්, කකුළුවන් සහ අනෙකුත් අපෘෂ්ඨවංශීන් වගාව | හෙක්ටයාරයකට (හෝ ඊට වැඩි වන සෑම කොටසක් සඳහා ම) 750.00 බැගින් |
| (අ) | හෙක්ටයාර් 1 ක් හෝ ඊට වැඩි වන සෑම ඉඩම් කොටසක කිවුල් දිය පොකුණුවල ඉස්සන් වගාව | හෙක්ටයාරයකට (හෝ ඊට වැඩි වන සෑම කොටසක් සඳහාම) 1,000.00 බැගින් |
| (ii) | හෙක්ටයාර් 4 ඉක්මවන ඉඩම් ප්‍රමාණයක මිරිදිය පොකුණුවල වරල් මසුන් සහ මිරිදිය ඉස්සන් වගාව | හෙක්ටයාරයකට 500.00 බැගින්", |

(ii) එහි (x) වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් :-

| | | |
|---|---|---|
| "(x) | කෘත්‍රිම උපස්ථර මත ජලජීවී වගාව 1,000 දක්වා | 2,000.00 |
| (අ) | උපස්ථර 1,000 ට වැඩි වන අවස්ථාවලදී එසේ වැඩි වන සෑම උපස්ථරයක් සඳහා ම | 2.00 |
| (xi) | අනෙකුත් ජලජ වගා පද්ධති | 2,000.00" |

(4) I වන උපලේඛනයේ "ඈ" කාණ්ඩයට ඉක්බිතිව ම වූ ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"මෙයට අමතරව, මෙම නියෝගවල 1 වන උපලේඛනයේ "අ" ගණයේ (iii) වන අයිතමය හැර, හෙක්ටයාර් 1 ක් හෝ ඊට අඩු ඉඩම් ප්‍රමාණයක පරීක්ෂණ ගාස්තු වශයෙන් රුපියල් දහසක (රු. 1,000/-) මුදලක් අයකරනු ලැබිය යුතු ය. ඉන්පසු වැඩිවන සෑම හෙක්ටයාරයක් සඳහා ම හෝ එය ඉක්මවන සෑම කොටසක් සඳහා ම රුපියල් දෙසීයක (රු. 200/-) මුදලක් අය කරනු ලැබිය යුතු ය. තව ද, විසිතුරු මත්ස්‍ය වගාව සහ කෘත්‍රිම උපස්ථර මත ජලජීවී වගාව සඳහා පරීක්ෂණ ගාස්තු වශයෙන් රුපියල් දහසක (රු. 1,000/-) මුදලක් අයකරනු ලැබිය යුතු ය;" සහ

(5) II වන උපලේඛනයේ "8.1" අයිතමය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"8.1 ඉඩම

(i) තමන් සතු (ඔප්පුවේ අංකය සඳහන් කරන්න) ..........................................................................

(ii) ජලජීවී වගා ව්‍යාපාරයේ ප්‍රමාණය (හෙක්ටයාර් හෝ වර්ග මීටර) ...........................................

(iii) බද්දට ගත් (බලපත්‍ර අංකය) ..........................................................................................

(iv) අරය කි. මී. 0.5 ක් ඇතුළත ඉඩම භාවිතය ..................................................................

(v) අරය කි. මී. 1 ක් ඇතුළත පවතින කර්මාන්ත ලැයිස්තුව ......................................................"

03-1254

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.